# බුදු ගුණයට පැහැදී රෝපණය කරන්න බෝධියක් නිවන් දකින තෙක් ලබන්න සුගති සම්පත්

## අසනබෝධිය ස්ථවිරාවදානය ඇසුරින්

(බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, ඛුද්දක නිකාය, අපදානපාළි 1 - පිටු අංක 194 - 197)

සත් හැවිරිදි දරුවෙක් තිස්ස බුදු රජාණන් වහන්සේගේ ගුණයට පැහැදී සතුටු සිතින් බුදු රජාණන් වහන්සේගේ බෝධියෙන් ඵලයක් ගෙන රෝපණය කළා. එයින් පැල වූ බෝ ගස අවුරුදු පහක් ම පෝෂණය කළා.

ඔහුට ලැබුණේ මහත් ආනිසංසයක්. කල්ප අනූදෙකකට පසු ගෞතම සම්බුද්ධ ශාසනයේ රහත් බව ලබන තෙක් සුගතියේ ම යි ඉපදුණේ. සක්විති රජ සම්පත් ද ඔහුට ලැබුණා. අනන්ත වූ බුදු ගුණයට කළ පූජෝපහාරයේ විපාකයයි ඒ.